# පුංචි ලිලීට අදහසක්

එන්. ආර්. මහීමා සසඳරී
නාරංගොඩ

# පුංචි ලිලීට අදහසක්


**එන්. ආර්. මහීමා සසඳරී නාරංගොඩ**

කතෘ



**මහාමායා බාලිකා විද්‍යාලය**

**7 වසර E**



**2026.06.10**

ISBN
978-624-211-443-9

# පිදුම

අංකුර සිතුවිල්ලකට

ජීවය ලබාදුන්

මහාමායා විදුහල් මෑණියන්ට

ආදරයෙන්



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

CamScanner

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,  
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.  
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.  
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

එකමත් එක රටක පුංචි ගෑනු ළමයෙක් හිටියා ලිලී කියලා. එයා ගොඩාක් ලස්සනයි. එයාට හිටියා පුංචි බලු පැටියෙකුයි පුංචි පූස් පැටියෙකුයි. එයා ඒ දෙන්නත් එක්ක ඉන්න ගොඩාක් කැමතියි. එයා හිටපු ගම වටවෙලා තිබුනේ ලොකු කැලෑවකින්. ඒකේ ගොඩාක් බය හිතෙන සත්තු හිටියා. වලස්සු, දිවියෝ වගේ ගොඩාක් සත්තු හිටියා.



ලිලී හැමතැනම දුව දුව පූස් පැටියයි බලු පැටියයි එක්ක සෙල්ලම් කරා. ඒ පූස් පැටියගේ ඇස් කොළ පාට නිසා හරිම ලස්සනයි. බලු පැටියාගේ ඇස් දෙක නම් දුඹුරු පාටයි. එක දවසක් රෑ පුංචි ලිලී ඇඳට වෙලා අම්මා කියලා දෙන කතන්දරේ අහගෙන හිටියා. ඕකේ තිබුණේ මෙහෙම. ඔන්න එකමත් එක ගමක් තිබුණා. ඒක වට වෙලා තිබුණේ ලොකු කැලෑවකින්. ඒ කැලෑව ඇතුලේ මකරු ඉන්නවා. ඒ මකරු හරිම ලොකුයිලු. හැබැයි උන් තමාට කරදරයක් නොවේ නම් කාටවත් කරදරයක් කරන්නේ නැලු. ඒ මකරුන්ව අල්ලන්න යන කාටවත්ම ආයෙ එන්න හම්බවෙලා නෑ. පුංචි ලිලී ඒ කැල්ල ඇහුවා විතරයි හැංගුනාලු. පුංචි ලිලී ඒත් ඒක අහන් හිටියා. අම්මා කතාව ඉවර කරාට පස්සේ ලිලී සනීපෙට නිදාගත්තා.



# පුංචි ලිලීට අදහසක්




ඔන්න ආයෙත් අලුත් දවසකට ඉර පෑයුවා. අපේ පුංචි ලිලී නැගිට්ටා. උදේම ගිහිල්ලා මූණ හෝදගෙන කුස්සියට ගියා කෑම කන්න. කාලා ඉවර වුණා විතරයි ගියා පූස් පැටියයි බලු පැටියයි ළඟට. ගිහිල්ලා හැම තැනම දුව දුව සෙල්ලම් කරා. තණකොළ අස්සේ හැංගුණා. ගස් අස්සේ හැංගුණා. හැංගුනේ නැති තැනක් හොයාගන්නවත් බෑ. පුංචි ලිලීට හිටියා යාළුවෙක්. එයාගෙ නම ලූනා. එයත් මෙයා වගේමයි. සෙල්ලම් කිව්වොත් ඕන දෙයක්. එයා හිටියේ ඒ අයගේ ළඟ ගෙදරක. ඉතින් හැමදාම මේ දෙන්නට එකට සෙල්ලම්

කරන්න ලැබෙනවා. ඔහොම මේ දෙන්නා සෙල්ලම් කර කර ඉද්දි පුංචි ලිලීට මතක් වුණා අම්මා කියලා දුන් කතාව. පුංචි ලිලී ඒ කතාව ලූනාට කිව්වා. එයා ඒ කතාව අහලා පුදුම වුණා. එයා ලිලීට කිව්වා ඒ කතාවේ තියෙන ගමත් අපේ ගමට සමානයි කියලා. එතකොට ඒ පුංචි ලිලී කිව්වා, අපි මකරු හොයාගෙන යමු හැබැයි එයාලා ඇත්තද දන්නෑ? ඔයා හෙට රෑට අපේ ගෙදරට එන්න. අපි මගේ පුංචි පූස් පැටියයි, බලු පැටියයි අරගෙන යමු. එතකොට අපිට තියෙන බය ටිකක් හරි අඩු වෙයිනේ. ඒත් අම්මලා අපිට එන්න දෙයිද ලූනා ඇහුවා. ඉතින් අපි අම්මලාට කියන්නේ නැතුව යමු. ඒක හොඳයි ලූනා කිව්වා. අන්න අම්මා මට කතා කරනවා සුභ ගමන් ලිලී හෙට හම්බ වෙමු ලූනා කිව්වා.



# පූස් පැටියයි බලු පැටියයි අතුරුදහන්



ඔන්න උදේ උනා. ලිලී හැමදාම වගේ මූණ හෝදලා කුස්සියට ගියා. ගිහිල්ලා කෑම හොඳට කෑවා. "අද හරිම රස්නෙයි නේද  අම්මා" පුංචි ලිලී අම්මට කිව්වා. ඔව් දුවේ. තාත්තේ මට කාඩ්බෝඩ් කඩුවක් හදලා දෙනවද  සෙල්ලම් කරන්න. හා දුවේ ඒත් කාත් එක්කද? ලූනාත් එක්ක තාත්තේ. එන්න ලූනා අපි සෙල්ලම් කරමු. ඉන්න පුංචි පූසාටයි පුංචි බලු පැටියටත් එන්න කියමු. කිටී එන්න එන්න. පුංචි පපී එන්න එන්න සෙල්ලම් කරන්න. අනේ කෝ මේ දෙන්න හොයාගන්න නෑනේ. අපි තාම හැමතැනම බැලුවෙ

නැනේ. ලූනා කිව්වා. එන්න අපි බලමු. ඔයා අර පැත්ත බලන්න. මම අර පැත්ත බලන්නම්. අනේ ඒ දෙන්නා නැනේ මං හැමතැනම බැලුවා අනේ… ඒ දෙන්නා කොහෙ ගිහින්ද මට ඒ දෙන්නා නැතුව ඉන්න බෑ. ඔයා අඬන්න එපා ලිලී. අපි කොහෙන් හරි එයාලව හොයාගමු. පව් අනේ ඒ දෙන්නා හොඳින් හිටියොත් මට ඇති. අපි හෙට හොයන්න යනවනේ නේද ලිලී. ඔව් අනිවාර්යයෙන්ම.

# ගවේෂණය පටන් ගනියි.




උදේ විය. ලිලී හැමදාම වගේ සෙල්ලම් කරන්න එළියට ගියා. ලූනා අපි අද යනවද? ලිලී ඇහුවා. ඔව් ඔව් අනේ හවස් උනා. දෙන්නම ගිහිල්ලා කාලා බඩු ලෑස්ති කරගත්තා. තාත්තා කඩුව හැදුවද? ඔවු මේ අර තියෙන්නේ ඒක හොඳයිද? ඔවු හොඳයි තාත්තේ. මම එළියට ගිහින් එන්නම්. හා පරිස්සමට ගිහින් එන්න. එන්න ලූනා කිව්වා.

බය වෙන්න එපා මාත් එනවා. ලිලී ලූනාට කිව්වා. ලිලීයි ලූනයි දෙන්නම කැලෙ ඇතුළට ගියා. මේක හිතුවට වඩා

ගොඩක් ලොකුයිනේ. ඒක තමා ලූනා කිව්වා. අන්න බලන්නකෝ ලූනා කොළපාට ඇස් දෙකක්. ඒ මගේ කිටීනේ. අන්න එයා ගියා ලූනා කිව්වා. එන්න අපි එයා පස්සේ යමු ලූනා. ඉක්මන් කරන්න ලිලී කිව්වා. දෙන්නා පූස් පැටියා පස්සේ දිව්වා. ඒත් පූස් පැටියා එයාලට වඩා වේගවත්. ඒ නිසා ඒ දෙන්නට පූස් පැටියව මග හැරුනා. අයියෝ ලිලී හඩා වැලපුණා. දැන් අපි මොකද කරන්නේ. කරන්න දෙයක් නෑ. ලූනා කිව්වා. එන්න අපි ඉස්සරහට ම යමු. රෑ උනා කලුවරයි. පුංචි යාළුවෝ දෙන්නට එළියක්වත් නෑ. ලූනා අපි ගහක් යට පුංචි කූඩාරමක්වත් ගහමුද? නැත්තම් අපිට මේ අන්ධකාර කැලේ ඉන්න වෙන්නේ. මම දර හොයන් එන්නම්. පොඩි ගිනිමැලයක් ගහන්න ලූනා කිව්වා. මම කොළ ටිකක් ගේන්නම්. දෙන්නා දෙපැත්තට බෙදිලා ගියා. ලූනා ගොඩක් දර හොයාගත්තා. ලිලීත් ගොඩක් කොළ හොයා ගත්තා. දෙන්නා පුංචි කූඩාරමක් හදා ගත්තා. එයාලා මුළු රෑම කූඩාරමට වෙලා හිටියා. සත්තු කෑගහන සද්ද ඇහෙනවා හරිම බයයි.

# සේරම හරි



ඊළඟ දවසේ උදේ එයාලට පුංචි පූස් පැටියයි බලු පැටියයි දෙන්නම හම්බවුණා. ඒත් එයාලට අර කතාවේ තිබ්බ විදියට මකරුනම් හොයාගන්න බැරිවුණා. හැබැයි කමක් නෑ. ඒ දෙන්නට එයාලගේ සුරතල්ලූ දෙන්නව හම්බවුණා. අම්මලා දැන් හොදටම බයවෙලා ඇති. ලිලී කීවා.

ඒ නිසා අපි දැන්ම යමු. ඔව් අපි දැන්ම යමු. ඔන්න ලූනායි ලිලීයි ගෙදර ගියා. අම්මලා මේ දෙන්නව දැක්කට පස්සේ ගොඩක් සතුටු වුණා. මෙයාලා එදයින් පස්සේ ඉඳලා සතුටින් ජීවත් වුණා.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN
978-624-211-443-9

CS CamScanner